16B

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

1727

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

# ඉතිහාසය I

කාලය / நேரம் / Time: පැය 1 යි

නම / பெயர் / Name ..............................
විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

* අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවලදී **1,2,3,4** යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුරු තෝරන්න.

01) ගම්පොළ රාජධානි සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා දේශපාලනික තොරතුරු ඇතුළත් ඓතිහාසික මූලාශ්‍රය කුමක්ද?
1. රාජාවලිය 2. නිකාය සංග්‍රහය 3. පැරකුම්බා සිරිත 4. මයුර සංදේශය

02) පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන රූප සටහන කුමක්ද?
1. මුරගල 2. වාමන රූප 3. ගොන්කුරය 4. සඳකඩපහන

03) ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහත රට තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ
1. හෝර්ටන්තැන්න ය. 2. පතිරාජවෙල ය. 3. පොතාන ය. 4. බෙල්ලන්බැඳිපැලැස්ස ය.

04) පූර්ව ඓතිහාසික යුගයේ විධිමත් සුසාන ක්‍රම අතරින් මැටි ඔරු සුසාන සොයාගත් ස්ථානය කුමක්ද?
1. ඉබ්බන්කටුව 2. රංචාමඩම 3. යාපහුව 4. යටිගල්පොත්ත

05) කිරිදි ඔය හරස් කර අමුණක් බැද ජලය ලබාගෙන තිස්සමහාරාම වැව ඉදිකරවූ රජතුමා කවුරුන්ද?
1. අභයනාග 2. වසභ 3. ඉලනාග 4. මහානාග

06) පරුමක වරුන්ට කිසියම් ආකාරයක ප්‍රාදේශීය පාලන බලයක් හිමි ව තිබූ බව පෙන්වාදීමට හැකි සෙල්ලිපිය කුමක්ද?
1. කොත්ගල්කන්ද 2. පෙරිමියන්කුලම 3. තෝනිගල 4. දෙවනගල

07) ගමිකයන් ගෘහපතියන් අතරින්ම පත් වූ කෙනෙකු බව සඳහන් සාහිත්‍ය කෘතිය කුමක්ද?
1. බුත්සරණ 2. අමාවතුර 3. විනයට්ඨ කතා 4. සමන්තපාසාදිකාව

08) වැව් පද්ධතියක් හා ඊට අයත් ගම් කිහිපයක ජීවත් වූ ගැමියන්ගේ සුබ සිද්ධිය වෙනුවෙන් තීරණ ගත් පුද්ගලයා කවුරුන්ද?
1. පරුමක 2. ගමික 3. අධික 4. ගෘහපති

09) විමධ්‍යගත පාලනබලය භුක්ති විඳිමින් සිටි පරුමකවරුන් සම්බන්ධ කරගෙන මධ්‍යගත පාලනයක් බිහිකිරීමට පුරෝගාමී වූ රජතුමා කවුද?
1. පණ්ඩුකාභය 2. දේවානම්පියතිස්ස 3. දුටුගැමුණු 4. වසභ

10) නිශ්ශංකමල්ල රජතුමා සිය සෙල්ලිපිවල තමන්ව හැඳින්වීමට යොදාගත් රාජ්‍ය සංකල්පය කුමක්ද?
1. චක්‍රවර්ති 2. පර්වතරාජ 3. බෝධිසත්ව 4. දේවත්ව

11) ක්‍රි.ව.නවවන සියවසේ සෙල්ලිපිවල 'සභාව' ලෙස හඳුන්වා ඇත්තේ
1. විධායකය යි. 2. අධිකරණය යි. 3. ව්‍යවස්ථාදායකය යි. 4. රාජසභාව යි.

12) මන්නාරමේ පිහිටි මහා තිත්ථ වරායට ආසන්නව ඉදිකර ඇති පැරණි හින්දු කෝවිල කුමක්ද?
1. නල්ලූර් 2. කෝනේෂ්වරම් 3. මුන්නේෂ්වරම් 4. තිරුකේතීෂ්වරම්



EXAMRESULTS.LK

✸ පහත සඳහන් කරුණු අධ්‍යානය කර 13,14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. කිරිගෙරි    B. පිටබිම්    C. කනත්ත    D. කෙත    E. කන්නය

13) කාලයක් අතහැර දමා යළිත් වගාකළ ඡේන් හැඳින්වීමට අතීතයේ භාවිතා කළ වචනය හා සම්බන්ධ පිළිතුරු වන්නේ

1. E    2. C    3. D    4. B

14) ගව පාලනය හා සම්බන්ධ පිළිතුර ඇතුළත් අක්ෂරය කුමක්ද?

1. B    2. D    3. C    4. A

15) වෙහෙරකෙම සෙල්ලිපියේ සඳහන් තතවය නමින් හැඳින් වූ කර්මාන්තය කුමක්ද?

1. කම්හල්    2. ඇත්දත්    3. රෙදි විවීම    4. කුඹල්

16) අතීත මුතුන් මිත්තන් ජලයේ තරංග ක්‍රියාකාරීත්වයේ බලය අවබෝධ කර ගනිමින් එය පාලනය කිරීමට කරනු ලැබූ නිර්මාණය කුමක්ද?

1. රළපනාව    2. බිසෝකොටුව    3. පිටවාන    4. සොරොව්ව

17) ක්‍රි.පූර්ව. 1350 දී ඉදිකරන ලද සොහොන් ගර්භයක ඇටසැකිලි පිළිස්සීමේදී මැටි නලයක් සවි කර තිබීමෙන් පැහැදිලි වන්නේ,

1. උචිත මැටි වර්ග යොදාගත් බව ය.
2. සමබරතාව ආරක්ෂා වන අයුරින් ගර්භය ඉදිකල බව ය.
3. දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බව ය.
4. හර්භයේ බිත්ති සනකමින් යුක්ත බව ය.

18) අතීතයේ මැටි බඳුන් තැනීමේදී අනුගමනය කර ඇති ප්‍රායෝගික පියවර පිළිවෙලින් පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර වන්නේ,

A. නියමිත උෂ්ණත්වයට බඳුන පුලුස්සා ගැනීම
B. මැටි පදම් කර ගැනීම
C. සුදුසු මැටි වර්ග සොයා ගැනීම
D. පිළිස්සීමට උඳුනක් තනා ගැනීම

1. ABCD    2. CBDA    3. BCDA    4. DBCA

19) අතීතයේ මහ වැව් තැනීමේ අරමුණක් නොවන්නේ

1. ගංවතුර පාලනය
2. නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීම
3. කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම
4. විදුලිබල උත්පාදනය

20) පැරණි කාලයේ ඌරා කැට ළිං ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූයේ කුමක්ද?

1. අපවිත්‍ර ජලය පිරිසිදු කර ගැනීම
2. භික්ෂු වහන්සේගේ පැන් පහසුව
3. ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කර ගැනීම
4. ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම

21) ආලාහන පිරිවෙන නමින් හැඳින්වෙන නටබුන් සහිත භූමිය පිහිටා ඇති ප්‍රදේශය කුමක්ද?

1. පොළොන්නරුව    2. අනුරාධපුරය    3. දඹදෙණිය    4. දෙවිනුවර

(22) පහත x හා y තීරු නිවැරදිව ගැළපූ විට අදාළ පිළිතුර වන්නේ

| X | y |
|---|---|
| 1. අවකාශය | A හවජර |
| 2. කාලය | B ගුන්ජා |
| 3. දිග | C අමුණ |
| 4. බර | D වියත |

1. BACD
2. CADB
3. ABCD
4. CBDA

23) අතීත සමාජ ධූරාවලියට අනුව පහල මට්ටමේ සිටි පිරිස හඳුන්වා ඇත්තේ කුමන නමකින්ද?
1. කුඩීන් 2. ප්‍රභූන් 3. භානකවරු 4. දාසයන්

24) අතීතයේ පැවැති බදු නීතිය අනුව වැව් වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද කුමක්ද?
1. දකපති 2. බොජකපති 3. මතරමජිබක 3. ගෘහදණ්ඩ

✹ පහත A සිට E දක්වා සඳහන් කර ඇති සෙල්ලිපිවලට අනුව 25,26 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය
B. වේවැල්කැටිය සෙල්ලිපිය
C. සොරබොරවැව ටැම් ලිපිය
D. බුද්ධන්නෙහෙළ ටැම් ලිපිය
E. බෝවත්තෙගල සෙල්ලිපිය

25) පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධව දැක්වෙන සෙල්ලිපි කාණ්ඩය කුමක්ද?
1. AB 2. AD 3. CD 4. BD

26) වෙළදාම සම්බන්ධව දැක්වෙන සෙල්ලිපි කාණ්ඩය කුමක්ද?
1. AD 2. BC 3. AB 4. CE

✹ **පහත A,B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 27 සිට 29 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(A) 1. පොළොන්නරුව බිඳවැටීම
2. කාලිංග මාඝ ආක්‍රමණය

(B) 1. දඹදෙණි රාජධානිය
2. පස්වන වන මිහිඳු

(C) 1. මුල්ම රාජධානිය
2. අනුරාධපුරය

(D) 1. චෝලයින්ගෙන් රට මුදවා ගැනීම
2. පළමුවන විජයබාහුගේ රාජ්‍යත්වය තහවුරු වීම.

(27) පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවන් නොදැක්වෙන යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

(28) පළමුවැන්න ඇතිවීමට දෙවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය
1. A 2. B 3. C 4. D

(29) දෙවැන්න බිහි වූයේ පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දැක්වෙන යුගලය
1. A 2. B 3. C 4. D

(30) සේනා සම්මත වික්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයා වූයේ කවුරුන්ද?
1. කරලියැද්දේ බණ්ඩාර 2. ජයවීර බණ්ඩාර
3. යමසිංහ බණ්ඩාර 4. කොනප්පු බණ්ඩාර

(31) උඩරට රාජ්‍යය තුළ ක්‍රියාත්මක වූ 'හැඳ' බද්ද සංවිධානයේ කාර්යය වූයේ
1. රෙදි සේදීම 2. ඇතුන් ඇල්ලීම 3. රෙදි විවීම 4. වළං තැනීම

(32) මහනුවර රාජධානියේ ඉඩම් අයිතිය හා බුක්තිය අනුව ගබඩාගම් ලෙස හැඳින්වූයේ

1. දේවාල සඳහා පූජා කළ ඉඩම් ය.
2. රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් කළ ඉඩම් ය.
3. ගම් වැසියන් පරම්පරාගත ව බුක්ති විඳි ඉඩම් ය.
4. රදළ ප්‍රධානීන් කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කළ ඉඩම් ය.

(33) දෙවන රාජසිංහ නමින් රජ වූ කුමාරයා කවුරුන්ද?

1. විජේපාල කුමරු 2. කුමාරසිංහ කුමරු 3. මහ අස්ථාන කුමරු 4. ටිකිරි කුමරු

(34) මහනුවර රාජ්‍යය තුළ ප්‍රාදේශීය පාලනයේ දී මුහන්දිරම්වරුන් යටතේ ගම් භාරව සිටි පිරිස හඳුන්වනු ලැබූ නම කුමක්ද?

1. උණ්ඩිය රාළ 2. කෝරළේ 3. දිසාව 4. විදානේවරු

(35) පුනරුද සමයේ කතෝලික සභාව විවේචනය කළ චින්තකයින් සහ අදාළ රට ගැලපූ විට නිවැරදි පිළිතුරු වන්නේ

| X | Y |
|---|---|
| 1. ජෝන් වයික්ලිප් | A. බොහිමියාව |
| 2. ජෝන් හස් | B. ප්‍රංශය |
| 3. ඉරාස්මස් | C. ජර්මනිය |
| 4. මාටින් ලූතර් | D. එංගලන්තය |

1. ABCD 2. DABC 3. DACB 4. BCDA

(36) 'ලෝරාට සැහැලි කවි' නම් ග්‍රන්ථය රචනා කළ ගත් කතුවරයා කවුරුන්ද?

1. ඩාන්ටේ 2. බොකැෂියෝ 3. පෙට්‍රාක් 4. ෂෙක්ස්පියර්

(37) 'අත්හදා බැලීමේ පියා ' ලෙස හැඳින්වෙන ඉතාලි ජාතික විද්‍යාඥයා කවුරුන්ද?

1. අයිසෙක් නිව්ටන් 2. ගැලීලියෝ ගැලලි
3. නිකලස් කොපර්නිකස් 4. ජොහැන්නස් කෙප්ලර්

(38) කොන්ස්තන්තිනෝපල් නගරය වර්තමානයේ හඳුන්වන නම කුමක්ද?

1.රෝමය 2. ජිනෝවා 3. ඉස්තාන්බුල් 4. වැනීසිය

(39) ඉන්දියාවට ගොඩ බැසීමෙන් පසු ' ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු' යනුවෙන් ප්‍රකාශ කළ නාවිකයා කවුරුන්ද?

1. ලොරේන්සෝද අල්මේදා 2. වස්කෝද ගාමා
3. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා 4. පිලිප්ද ඔලිවේරා

(40) උපසම්පදාව මෙරට ට ගෙන ඒම සඳහා උඩරට රජවරුන්ට නැව් සපයමින් උදව් උපකාර කළ බටහිර ජාතිය කවරෙක්ද?

1. පෘතුගීසි 2. ඉංග්‍රීසි 3. ලන්දේසි 4. ප්‍රංශ

10B

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

1909

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය | ඉතිහාසය II | කාලය / நேரம் / Time: පැය 3 යි |

නම / பெயர் / Name ..............................
විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

අමතර කියවීම් කාලය: විනාඩි 10යි

✱ සැලකිය යුතුයි.

i කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

ii කොටසින් ප්‍රශ්න හතරකට ද iii කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

i කොටස

01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලටම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිදී (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(i) මුලතිව්, මාතොට, ගෝඨපබ්බත, ගෝකණ්ණතිත්ථ, ගම්පොළ, සල්වතොට, දේවනගර, පරාක්‍රම සමුද්‍රය, ගල්ඔය, කළු ගඟ, කලාවැව, රංචාමඩම (ල 12)

(ii) ඉතාලිය, කැලිකට්, රතුමුහුද, කොන්ස්තන්තිනෝපල්, පෘතුගාලය, මලක්කා සමුද්‍ර සංධිය (ල 6)

(ආ) (i) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර වඩාත් පැරණිතම කෘතිය කුමක්ද?

B. අනුරාධපුර රාජධානි සමයේ 'උපසග්ගරෝගනාසා' නම් විශේෂ රෝහලක් ඉදිකරවූ රජතුමා කවුරුන්ද?

C. දකුණු ආසියාව පුරා පැතිරී ගිය ශ්‍රී ලාංකික වාරි තාක්ෂණික නිර්මාණය කුමක්ද?

D. සීතාවක රාජසිංහ රජුට උඩරට ආක්‍රමණයේදී සහය දුන් උඩරට ප්‍රභුවරයා කවුරුන්ද? (ල 4)

A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.


(ii) 1) A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2) මෙම නිර්මාණයේ ඇති විශේෂත්වය කුමක්ද?

3) මෙය කරවූ රජතුමා කවුරුන්ද?

4) මෙය පිහිටා තිබෙන ඓතිහාසික නගරය කුමක්ද?

A



(ල 4)

(iii) 1) B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2) මෙය හමු වූ ස්ථානය කුමක්ද?

3) මෙය තැනීමට භාවිතා කර ඇති ලෝහය කුමක්ද?

4) මෙම ස්ථානය හා සම්බන්ධ රජතුමා කවුරුන්ද?

B



(ල 4)

ii කොටස

02) i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත රට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න. (ල 3)

ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර පිණිස දඩයම් කළ සතුන් හතර දෙනෙක් සඳහන් කරන්න. (ල 4)

iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කළ බව නිදසුන් දෙකක් දක්වා විස්තර කරන්න. (ල 5)

iv) A සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන වාපි ගම්වලට උදාහරණ තුනක් ලියන්න (ල 3)

B පහත සඳහන් වෘත්තිකයින් විසූ ගම් අතීත මූලාශ්‍රයවල හඳුන්වා ඇති ආකාරය ලියා දක්වන්න.

1. ධීවරයන් විසූ ගම්
2. ගොවියන් විසූ ගම්
3. වළං සාදන්නන් විසූ ගම් (ල 3)

03) i) පහත සඳහන් තනතුරු දැරුවන් පුරාණ කාලයේ සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ කෙසේද?

1. පවුලක ප්‍රධානියා 2. ගම් ප්‍රධානීන් 3. වැව් පද්ධතියක ප්‍රධානියා

(ල 3)

ii) පහත A සිට D දක්වා සඳහන් කර ඇති නිළධාරීන්ගේ කාර්ය ලියා දක්වන්න.

A - අස අදෙක :-

B - නට අදෙක :-

C - රූප අදෙක :-

D - පන අදෙක :- (ල 4)

iii) දුටුගැමුණු රජතුමාගේ ආගමික සහ දේශපාලනික සේවා එක බැගින් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු තම අසල්වැසි රටවල් සමග මිත්‍රශීලී සම්බන්ධතා පැවැත්වූ බවට උදාහරණ තුනක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ල 6)

04) i) අතීතයේ හේන්වල වගා කරන ලද බෝග වර්ග තුනක් නම් කරන්න. (ල 3)

ii) පුරාණ කාලයේ හේන් වගා කිරීම වෙනුවෙන් ඇතැම් රජවරු අය කළ බදු වර්ග දෙක සඳහන් කරන්න. (ල 4)

iii) පුරාණ කාලයේ මෙරට දියුණු කර්මාන්ත රාශියක් පැවැති බවට නිදසුන් දෙකක් දක්වා විස්තර කරන්න. (ල 5)

iv) අතීතයේ අප රටේ විසූ ජනතාව විවිධ ජන කොටස් සමග ඉතා සුහදශීලිව කටයුතු කර ඇති බව උදාහරණ තුනක් දක්වා පැහැදිලි කරන්න. (ල 06)

05) i) පහත සඳහන් වැව් ඉදිකරවීමට මූලිකත්වය ගත් රජවරු පිළිවෙලින් නම් කරන්න.

A. තිසා වැව B. මින්නේරිය වැව C. කලා වැව (ල 3)

ii) අතීතයේ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය පිළිබදව සාක්ෂි හමුවන ස්ථාන දෙක නම් කරන්න. (ල 4)

iii) සෙල්ලිපිවලට අනුව අතීතයේ රජවරු අපරාධ නීතිය සම්බන්ධව දැඩිව කටයුතු කර ඇත නිදසුන් දෙකක් දක්වා විස්තර කරන්න. (ල 5)

iv) පැරණි කාලයේ ශ්‍රී ලාංකික කාන්තාවන්ට සමාජයේ හිමිව තිබූ ගෞරවය සහ නිදහස පිළිබදව කරුණු තුනක් දක්වා විස්තර කරන්න. (ල 6)

06) i) පළමු නාගරීකරණයට අයත් ප්‍රධාන නගර තුන සඳහන් කරන්න. (ල 3)

ii) අතීතයේ පැරණි නගර පරිහානියට බලපෑ හේතු හතරක් නම් කරන්න. (ල 4)

iii) පොළොන්නරු රාජධානිය බිදවැටීමෙන් පසු බිහි වූ රාජධානිවල ආර්ථික ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල 5)

iv) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලනික සේවා දෙකක් සහ සාහිත්‍ය සේවාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල 6)

07) i) උඩරට රාජධානියේ අගනුවර වන මහනුවර නගරයට ස්වාභාවික ආරක්ෂාව සැලසුණු ආකාර තුනක් සඳහන් කරන්න. (ල 3)

ii) පහත A,B,C,D ප්‍රකාශවලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා පිළිවෙලින් සඳහන් කරන්න.

A. දෝන කතිරිනා නමින් බෞතිස්ම ලැබූ කරලියද්ද බණ්ඩාර රජුගේ දියණිය

B. උඩරට රාජධානියේ අවසන් සිංහල රජතුමා

C. උඩරට රාජධානියේ කඳුකර ප්‍රදේශ වල වී වගා කළ ක්‍රමය

D. ශ්‍රී වික්‍රමරාජසිංහ නමින් උඩරට රජ වූ නායක්කර් වංශික කුමාරයා

(මුත්තුසාමි/හෙල්මලු ක්‍රමය /කුසුමාසන දේවිය/ශ්‍රී විජය රාජසිංහ /කන්නසාමි/ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ/ලියදි ක්‍රමය/සුනේත්‍රා දේවිය) (ල 4)

iii) පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ දේශපාලනික,ආගමික,ආර්ථික සේවා එක බැගින් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල 05)

iv) උඩරට රාජධානියේ සමාජ සංවිධානය තුළ පැවැති විවාහ ක්‍රම තුන දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 06)

## iii කොටස

08) i) පුනරුද සමයේ සිටි චිත්‍ර ශිල්පීන් තිදෙනෙක් සඳහන් කරන්න. (ල 3)

ii) පහත සඳහන් නව සොයා ගැනීම් බිහි කිරීමට දායක වූ පුද්ගලයින් වරහන් තුළින් තෝරා ලියන්න.

A. මුද්‍රණ යන්ත්‍රය

C. ගුරුත්වාකර්ෂණ නියමය

B. දුර දක්නය

D. රුධිර සංසරණ පද්ධතිය

(ජොහැන්නස් ගුටන්බර්ග්, විලියම් හාවේ, ගැලිලියෝ ගැලලි, අයිසෙක් නිව්ටන්, මයිකල් සර්වෙක්ස්, නිකලස් කොපර්නිකස්) (ල 4)

iii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් පිළිබඳව කෙටියෙන් විස්තරයක් කරන්න. (ල 05)

(iv) පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය දේශපාලන හා ආර්ථික කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 6)

09) i) පුනරුද සමයේ පහත සඳහන් දේශ ගවේෂකයන් සොයා ගත් රටවල් නම් කරන්න.

1) ඇමැරිගෝ වෙස්පුචි


2) පර්ඩිනන් මැගලන්


3) ක්‍රිස්ටෝපර් කොලොම්බස් (ල 3)

ii) දේශගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූ සාගරබද රටවල් දෙක සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වූ පුද්ගලයින් දෙදෙනෙක් නම් කරන්න. (ල 4)

iii) පුනරුද සමයේ දේශගවේෂණ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට හේතු වූ විද්‍යාත්මක සොයා ගැනීම් තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල 5)

iv) පුනරුද සමයේ යුරෝපයේ ඇති වූ ආර්ථික නවෝදයේ විශේෂ ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.


N


P